**මාධ්‍ය නිවේදනය**

2021 පෙබරවාරි 25, කොළඹදී...

Nestlé
Good food, Good life

# දරුවන් 10,000කගේ දුරස්ථ අධ්‍යාපනය හා ක්‍රියාශීලී ජීවිතය වෙනුවෙන් මයිලෝ, රුපියල් මිලියන 10ක් වටිනා තෑගි පිරිනමයි

වසංගත කාලසීමාව තුළ වැඩි කාලයක් නිවස තුළට වී ගත කිරීමට සිදුව ඇති පසුබිමක, තම දුරස්ථ අධ්‍යාපන කටයුතු සිදුකිරීමටත්, ක්‍රියාශීලී දිවි පැවැත්ම පවත්වාගැනීමටත් උපකාර වන ලැප්ටොප්, ටැබ්, රීලෝඩ්, ස්කූටර්, බයිසිකල් ඇතුළු රුපියල් මිලියන 10ක් වටිනා ත්‍යාග, දරුවන් 10,000ක් වෙත ලබාදීමට මයිලෝ තීරණය කර තිබේ. මේ අනුව 2021 පෙබරවාරි 18 සිට 2021 අප්‍රේල් දක්වා කාලය තුළ සෑම සතියකම පැවැත්වෙන දිනුම් ඇදීමෙන් දරුවන් 1,000 බැගින් ජයග්‍රාහකයින් ලෙස නම් කිරීමට මයිලෝ සූදානමින් සිටියි.

"මයිලෝ සන්නාමය නිරතුරුවම අපගේ පාරිභෝගිකයින්ට ජීවිතයේ ඉදිරියටම යාමට අවශ්‍ය පෝෂණය ලබාදී තිබෙනවා. විශේෂයෙන්ම ක්‍රියාශීලීව කාලය ගෙවමින්, නිරෝගිමත් ජීවන රටාවක් සඳහා ඔවුන්ට සහාය වීමත්, ධෛර්යය සැපයීමත් එහි ප්‍රමුඛ කාර්යයභාරයක්. කෙසේ නමුත් මේ වසරේදී තවත් එක් පියවරක් ඉදිරියට යාමට අපට අවශ්‍ය වුණා. දුරස්ථ අධ්‍යාපනය සහ මාර්ගගත (Online) පන්ති කාමර නිසා ඇතැම් පවුල් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳ අපිට බොහෝ තොරතුරු ලැබුණා. විශේෂයෙන්ම එක් දරුවෙකුට වඩා සිටින පවුල්වල එම අවශ්‍යතාවයන් පිරිමැසීමට තරම් ප්‍රමාණවත් තාක්ෂණික මෙවලම් හෝ ඩේටා පහසුකම් ඔවුන් සතුව නැහැ. ඒ වගේම තමන්ගේ දරුවන්ට එළිමහන් ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව නොතිබීම පිළිබඳව දුක් වන දෙමාපියන් පිළිබඳවත් අපට අසන්නට ලැබුණා. එම නිසා මෙවර ප්‍රවර්ධන වැඩසටහන හරහා අපිට අවශ්‍ය වුණේ තමන්ගේ දරුවන්ට ජීවිතයේ ඉදිරියටම යාමට අවශ්‍ය සම්පත් දෙමාපියන්ට ලබාදීමටයි", යනුවෙන් මයිලෝ අංශයේ අලෙවි කළමනාකරු මොහොමඩ් අලි මහතා පැවසීය.

ඒ අනුව පළමු සතියේ ජයග්‍රාහිකාවක් බවට පත්වීමට අනුරාධපුරයේ දිනෝදි දිසානායක දැරිය සමත්වූවාය. තමන්ට ලැබුණු ලැප්ටොප් පරිගණකය තම පවුලට විශාල සහායක් වූ  බව ඇය පැවසුවාය. "මමයි මගේ නංගියි අපේ අම්මගේ ජංගම

දුරකථනයෙන් online පන්ති වලට සහභාගී වෙනවා. සමහර අවස්ථාවල එකම විටක පන්ති පැවැත්වෙනවා. Online පන්ති වලට වඩා හොඳින් සහභාගී වීමට සහ අපගේ පාසල් කටයුතු පහසුවෙන් කරගන්නට අපිට Laptop එකක් හෝ Tab එකක් ලැබෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි අපි තරඟයට සහභාගි වුණේ. ගොඩාක් ස්තූතියි නෙස්ලේ මයිලෝ!"

පිළියන්දල පදිංචි සේතික මෙතුනිජ දරුවා ද මෙම තරඟය හරහා ළමා ස්කූටරයක් දිනාගත්තේය. ඔහුටත් ඔහුගේ සොයුරියටත් අවම වශයෙන් දිනකට පැය භාගයක හෝ ව්‍යායාම ලබාගැනීමට එය උපකාරී වන බව සේතිකගේ පියා පවසයි. "අපේ දරුවන්ගේ විනෝදය සඳහා පමණක් නොව ක්‍රියාශීලීව ඉන්නටත් වටිනා ත්‍යාගයක් ලැබීම ගැන අපි ඉතාම සතුටුයි. මේ දවස්වල දරුවන්ට ගෙදරටම වෙලා ඉන්න එක අපහසු දෙයක් නිසා, මේ වගේ ත්‍යාගයක් ලබා දීම ගැන අපි ඇත්තටම ස්තූතිවන්ත වෙනවා."

මෙම තරඟයට ඇතුළුවීම සඳහා දෙමාපියන් කළ යුත්තේ තම දරුවා මයිලෝ RTD (ක්ෂණික පානය) රස විඳින ආකාරය දැක්වෙන ඡායාරූපයක් ගෙන වට්ස්ඇප් හෝ වයිබර් හරහා 077768007 දුරකථන අංකයට හෝ තැපැල් පෙට්ටිය 189, කොළඹ යන ලිපිනයට ලිපියක් හෝ @MiloSriLanka ෆේස්බුක් පිටුවට සෘජුවම එවීම ය. එසේ එවීමේදී ඔවුන්ගේ නම, දුරකථන අංකය, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය ද සඳහන් කළ යුතුය. තරගාවලියේ කොන්දේසි ප්‍රකාරව සෑම සතියකම පැවැත්වෙන දිනුම් ඇදීමේදී අහඹු ලෙස ජයග්‍රාහකයින් 1,000 බැගින් තෝරාගැනීමට නියමිත ය. එම ජයග්‍රාහකයින්ට ලැප්ටොප්, ටැබ්, රීලෝඩ්, ස්කූටර්, බයිසිකල්, ස්කේට් බෝඩ්ස්, බාස්කට් බෝල්, ෆුට්බෝල්, ස්කිපින් රෝප්ස්, හෙඩ්සෙට්ස් හෝ පාසල් බෑග් ආදී ත්‍යාග හිමි වේ. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු @MiloSriLanka ෆේස්බුක් පිටුවෙන් ලබාගත හැක.